**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2019**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මතය වියාචනය
**-----------------**

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම
**---------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබ අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කම්වල ස්වභාවය හා ක්‍රියාකාරීත්වය මත පදනම්ව ඒවායෙහි ඵලදායී ජීවිත කාලය ගණනය කර ක්ෂය කිරීම සඳහා කටයුතු කළ යුතු වුවත් එකිනෙකට වෙනස් ඵලදායී ජීවිත කාලයන් සහිත ලී බඩු හා කාර්යාල උපකරණ සහ පරිගණක සහ මෘදුකාංග එකම වත්කම් කාණ්ඩයක් යටතේ වර්ගීකරණය කර සමාලෝචිත වර්ෂයේදී රු.15,514,734 ක ක්ෂය වෙන්කිරීමක් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලය ලාභ නොලබන මහජනතාවට සේවා සපයන අර්ධ රාජ්‍ය ආයතනයක් බැවින් ලී බඩු උපකරණ හා කාර්යාල උපකරණ, පරිගණක මෘදුකාංග හා විද්‍යුත් උපකරණ වසර 10 ක් ගණනය කිරීම කාලෝචිත යැයි සැලකිය යුතුය. | ප්‍රමිතිය ප්‍රකාරව එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයක් ඇති වත්කම් අදාළ වත්කම් කාණ්ඩයන් යටතේ වර්ගීකරණය කොට ඵලදායී ජීවිත කාලය පදනම් කර ගත් ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කොට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | පෙර වර්ෂවලදී ඉදිකිරීම් සම්පූර්ණයෙන් අවසන් කර දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.13,526,044 ක් වූ ගොඩනැගිලි සහ රු.7,692,368 ක් වූ සූර්ය පැනල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රාග්ධනිත නොකර නොනිමි වැඩ ගිණුමෙහි පෙන්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් ද, ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව මෙම වත්කම්වලට අදාළව රු.1,445,539 ක ක්ෂය ගැලපීම් නොකිරීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරුණි. | මාතලේ ප්‍රාදේශීය කාර්යාල නව ගොඩනැගිල්ල පළමු අදියර, ඉදිකිරීමට හා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත සූර්යබල පද්ධතියට අදාළව වැඩ නිමවුම් වාර්තාව මූල්‍ය කළමනාකරණ අංශයට ලැබී නැති බැවින් ඉදිරි වර්ෂයේ ගිණුම්වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ඉදිකිරීම් අවසන් කොට දැනට භාවිතයට ගනු ලබන ගොඩනැගිලි සහ සූර්ය පැනල ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රාග්ධනිත කොට අදාළ ක්ෂය අනුපාතයන් යටතේ ක්ෂය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ රු.348,563,841 ක් වූ දේපළ පිරියත උපකරණ ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 අනුව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 (92) (ආ) ඡේදය ප්‍රකාරව මෙම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක්ද සිදුකර නොතිබුණි. | වත්කම්වල ජීවිත කාලය නැවත අගය කිරීම සඳහා දැරීමට සිදු වන වියදම් පියවා ගැනීම සඳහා ඉදිරි වර්ෂයේ දී ඇස්තමේන්තු පිළියෙල කර භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර ගැනීමෙන් පසු වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කිරීමට කටයුතු කිරීමට සටහන් කරගෙන ඇත. | සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම් ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර ප්‍රමිත අංක 07 (92)(ආ) ඡේදය ප්‍රකාරව මෙම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක්ද කළ යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වන මුදල් ප්‍රවාහය රු.39,455,822 ක් වැඩියෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් පැන නැගුණු ශුද්ධ මුදල් ප්‍රවාහය රු.50,257,406 ක් අඩුවෙන්ද, මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.26,742,408 ක් වැඩියෙන්ද දක්වා තිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි නිවැරදිතාවය විගණනයේදී පිළිගත නොහැකි විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සිදු වී ඇති සටහන් කිරීමේ දෝෂයන් නිවැරදි කර සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය විගණනය සඳහා ලබාදී ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |
| (ඉ) රජයෙන් ලැබෙන ප්‍රදාන ගිණුම් තැබීම සම්බන්ධව මණ්ඩලය විසින් ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයට ලද රු.1,036,995,186 ක රජයේ ප්‍රදාන දෙයාකාරයකට ගිණුම්ගත කර තිබුණි. භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන හා අයහාර ප්‍රදාන වෙනම හඳුනාගැනීමට කටයුතු කර තිබුණු නමුත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ප්‍රදානවලින් ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමට වැය කළ රු.13,161,198 ක් වූ මුදල්ද ඇතුළුව මුළු ප්‍රදානයම සමාලෝචිත වර්ෂයේ අයහාර ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රජයේ ප්‍රතිපාදන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රාග්ධන වියදම් නියමිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස සටහන් කරනු ඇති නමුත් වෙනත් ව්‍යාපෘතිවලින් ලබාදෙන ප්‍රාග්ධන මිලදීගැනීම් සඳහා ප්‍රමිත අංක 11 පරිදි කටයුතු කළහොත් මණ්ඩලයට ලැබෙන රජයේ ප්‍රතිපාදනවලින් අඩුවනු ඇත. එබැවින් අමාත්‍යාංශයෙන් හෝ වෙනත් බාහිර පාර්ශවයන්ගෙන් ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් රජයේ ප්‍රදාන ලෙස නොසැලකෙන බැවින් ප්‍රමිත අංක 11 පරිදි සටහන් තබා නැත. | රජයේ ප්‍රදාන ගිණුම් තැබීම සඳහා එක් ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තොග සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක තොග අයිතමයක වටිනාකම රු.1,209,600 ක් අඩුවෙන් ගලපා තිබීම නිසා වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම ඉකුත් වර්ෂයේ උපචිත වියදම් අධි වෙන්කිරීම් සමාලෝචිත වර්ෂයේ ලාභයට නොගලපා ඉකුත් වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.1,137,131 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | තොග සමීක්ෂණය අනුව 2018-12-31 දිනට පොල් පැළ තවාන් ලෙජරයට අදාළ හිස් පොලි බෑග් තොග වටිනාකම රු.1,209,600ක් අඩුවෙන් දක්වා තිබීම නිසා තවාන් ලාභය අඩුවෙන් දක්වා තිබීමේ වරද 2020 මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදි තොග වටිනාකම ආරම්භක තොගයට ගැලපිය යුතු අතර උපචිත වියදම් අධි වෙන්කිරීම සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපිය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ රු.3,493,125 ක පොලි බෑග් මිලදී ගැනීම දෙවරක් මුදල් පොතට හා පොලිබෑග් මිලදී ගැනීමේ ගිණුමට සටහන් වීමේ වරද නිවැරදි කිරීමේදී දෝෂ සහගත ලෙස තවාන් වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ජංගම ගිණුම බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ තවාන් වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ජංගම ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වරද 2020 මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදි. | තවාන් වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ජංගම ගිණුම නිවැරදි කළ යුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ ගොඩනැඟිලි අලුත්වැඩියා සඳහා දරන ලද රු.2,577,450 ක වියදමක් ගොඩනැඟිලි ගිණුමට ප්‍රාග්ධනිත කර තිබීමෙන් වර්ෂයේ ගොඩනැඟිලි පිරිවැය සහ මෙහෙයුම් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2017, 2018 හා 2019 වර්ෂයන්හි ගොඩනැඟිලි අලුත්වැඩියා වියදම් රු.1,933,450 ක් ගොඩනැඟිලි ගිණුමටත් තවත් රු. 643,999 ක අලුත්වැඩියා කාර්යයන් ස්වයං මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඇති ප්‍රාග්ධන ගොඩනැගිලි අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් යටතේත් ප්‍රාග්ධනිත කර ඇත. | ප්‍රාග්ධනිත කරන ලද ගොඩනැඟිලි අලුත්වැඩියා වියදම නිවැරදි කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ වැලිගම කොළ මැලවීමේ රෝග මර්ධන වැඩසටහන වෙනුවෙන් රු.15,270,514 ක වියදමක් දරා තිබූ අතර ඒ වෙනුවෙන් රු.12,285,900 ක වටිනාකමක් අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය වී තිබුණි. ඒ අනුව ප්‍රතිපූර්ණය නොවූ රු.2,984,614 ක වටිනාකම ලැබිය යුතු ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | ප්‍රමාද වී ලැබී ඇති චෙක්පත් මාර්ගස්ථ මුදල් ලෙස සටහන් කිරීම මග හැරී ඇති අතර ඒවා 2020 මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | උපචිත සංකල්පය පදනම් කරගනිමින් වර්ෂයේ ආදායම් වියදම් හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) කප්රුක ණය ඇප ආවරණ අරමුදල සඳහා මණ්ඩලයේ දායකත්වය රු.2,789,450 ක් වුවත් ඇප ආවරණ දායකත්ව අරමුදලෙහි එය රු.1,156,300 ක් ලෙස සටහන් වී තිබීමෙන් රු.1,633,150 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | කප්රුක ණය ඇප ආවරණ අරමුදලෙහි නිවැරදි වටිනාකම ගිණුම් තුළ හඳුනාගත යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේදී ඇනවුම් කළ නමුත් වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබූ රු.1,140,000 ක් වටිනා රතු කුරුමිණි උවදුර හඳුනාගැනීමේ උපකරණ 120 ක් වත්කම් හා ණයහිමියන් ලෙස හඳුනාගෙන තිබිම නිසා වත්කම් හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2019-12-31 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් කර ඇත. 2020-02-10 දින මෙම උපකරණ මණ්ඩලයට ලැබී ඇත. | ඇනවුම් කරන ලද භාණ්ඩ මණ්ඩලයට ලැබීමෙන් පසු එහි වටිනාකම ගිණුම් තුළ හඳුනාගත යුතුය. |
| (උ) මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ඇනවුම් කර තිබූ නමුත් මේ දක්වා ලැබී නොතිබූ වෘත්තිමය කැමරාවක් හා ඩ්‍රෝන කැමරාවක් වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී කරන ලද රු.290,110 ක සදොස් ක්ෂය වෙන්කිරීම පසුකාලීන ගැලපුම් ගිණුමට බැර කිරීම වෙනුවට පොලී ආදායම් ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2017 වර්ෂයේ ඇණවුම් කරණ ලද නමුත් 2019.12.31 දින වන තෙක්ම එම භාණ්ඩ පොල් වගාකිරීමේ මණ්ඩලයට ලැබී නොමැත. ගිණුම්ගත කිරීමේ වරද ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලදී. | ඉකුත් වර්ෂයේදී කරන ලද සදොස් ක්ෂය වෙන්කිරීම පසුකාලීන ගැලපුම් ගිණුමට බැර කළ යුතුය. |
| (ඌ)නිකුත් නොකළ රු.337,796 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් කොන්ත්‍රාත් ණයහිමියන් ලෙස පෙන්වීම නිසා කොන්ත්‍රාත් ණයහිමියන් හා අත්තිකාරම් ගිණුම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිකුත් නොකළ අත්තිකාරම්, අත්තිකාරම් වශයෙන් හඳුනා නොගත යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.10,379,509 ක ණයගැති ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ තහවුරු කරන ලෙස සියලුම ණය ගැතියන්ට ලිඛිතව දන්වා යැවූ නමුත් ඔවුන් විසින් එම ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් කර නොමැත. | ණයගැති ශේෂ සනාථන විගණනය වෙත ලැබීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) 2015 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවතින රු.34,971,843 ක ලැබිය යුතු ශේෂය ගිණුම්කරණ දෝෂයක් බවට පිළිතුරු ඉදිරිපත් කර තිබුණද එය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් තැබීමේ දෝෂයක් නිසා ඉදිරියට ගෙනැවිත් ඇති මෙම ලැබිය යුතු ශේෂය ඉදිරි වර්ෂවලදී ස්වයං මූල්‍ය ඒකකයේ පොල් පැළ තවාන් ඒකකය මඟින් උපයන ලාභයට එරෙහිව කපාහැරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | අදාළ ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ණයගැති පෞද්ගලික සමාගම් දෙකකින් අයකර ගැනීම සඳහා නඩු තීන්දු ලබා දී ඇති පිළිවෙලින් රු.2,631,003 ක හා රු.1,176,375 ක මුදලක්ද, 2013 වර්ෂයේ සිට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් මණ්ඩලයට ලැබිය යුතු රු.6,573,572 ක මුදලක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මණ්ඩලය වෙත අයවීමට නියමිත මුදල් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ආ) මණ්ඩලයේ අභ්‍යන්තර අංශ අතර අයවිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් ශේෂය වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල දැක්විය නොහැකි වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලයට අයවිය යුතු රු.498,524 ක් ලැබිය යුතු ගිණුම් ලෙස දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත | අභ්‍යන්තර අංශ අතර අයවිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විය යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 137 | වටිනාකම රු.11,263,000 ක් වූ ගෙවීම් වවුචර් 16 ක් අනුමත කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | මූල්‍ය බලතල හා අධිකාරී සීමාව යටතේ බිල්පත සමඟ ලිපිගොනුව මඟින් අනුමැතිය ලබාගෙන ඇත. වවුචරයේ අනුමැතිය නොතිබීමේ ප්‍රමාද දෝෂය වලක්වා ගන්නා ලෙසට මූල්‍ය අංශයේ සියලුම නිලධාරීන් දැනුවත් කර ඇත. | මු.රෙ. 137 ප්‍රකාරව අනුමත කරන ලද වවුචර්පත් සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.141,088,348 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.14,885,097 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.126,203,251 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන් වියදම පෙර වර්ෂයට සාපේක්ෂව රු.232,873,296 කින් අඩු වීම මෙහෙයුම් ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

ජංගම අනුපාතය ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා 1:2.50 සිට 1:2.47 දක්වා අඩු වී ඇති අතර ක්ෂණික අනුපාතය 1:0.59 සිට 1:0.66 දක්වා වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 1.3 ක් වූ ලාභ අනුපාතය සියයට 14.1 දක්වා සමාලෝචිත වර්ෂයේ වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන් වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොල් සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවේ පොල් වගාකරුවන් සඳහා දැනුම හා තොරතුරු ලබා දීම, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රෝග/පලිබෝධ හානි මර්ධනය සඳහා උපදෙස් ලබා දීම, රෝග හා පලිබෝධ මර්ධනයට අවශ්‍ය කෘෂි රසායනික ද්‍රව්‍ය, පරපෝෂිතයන්, විලෝපිකයින් නිකුත් කිරීම සඳහා සම්බන්ධීකරණය, කොට්ඨාශයේ කෘෂිකාර්මික සේවා හා පොල් වගාව ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධව පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා දත්ත යාවත්කාලීන කිරීම සිදු කළ යුතු බව දක්වා තිබුණද එකී නිලධාරීන් විසින් පොල් මයිටා හානිය සම්බන්ධයෙන් දත්ත පවත්වාගෙන යාමක් හා දත්ත යාවත්කාලීන කිරීමක් සිදුකර නොතිබූ අතර ඒ පිළිබඳව අධීක්ෂණ නිලධාරීන්ගේ අවධානයද යොමු වී නොතිබුණි. | මයිටා හානිය සම්බන්ධ දත්ත රැස් කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කරන උපදෙස් 2020.01.22 දිනැති මයිටා හානි කළමනාකරණ ව්‍යාපෘතිය -2020 දරන චක්‍රලේඛය මඟින් ලබාදී ඇති අතර පොල් සංවර්ධන නිලධාරීන් විසින් අදාළ තොරතුරු රැස් කරමින් පවතී. | පොල් මයිටා හානිය සම්බන්ධයෙන් නිවැරදි වූ දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතු අතර එම දත්ත යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල සඳහා තවත් අතිරේක කොටසක් ඉදිකිරීම සඳහා අදාළ ආයතනවලින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකර කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමට එළැඹ තිබුණි. මේ හේතුවෙන් මණ්ඩලය විසින් මෙම ඉදිකිරීම සඳහා රු.14,388,275 ක මුදලක් වැය කර තිබියදී කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම ඉදිකිරීම් කටයුතු සිදු නොකර කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබූ අතර අදාළ නිවැරදි කිරීම් සිදු කොට කොන්ත්‍රාත්තුව නිම කරවා ගැනීමට මණ්ඩලය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් සිය කාර්යයන් පැහැරහැරීම සහ කාර්යසාධන සුරක්ෂණය දිර්ඝ කිරීමට අපොහොසත්වීම නිසා ඉදිකිරීම් උපදේශකගේද නිර්දේශය සහිතව කාර්යසාධන සුරක්ෂණය මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර ඇත. කොන්ත්‍රාත් ආයතනය විසින් ඉදිරිපස කොටස නිම කරන බවත් එහිදී මණ්ඩලයට මූල්‍යමය අලාභයක් සිදු වුවහොත් කොන්ත්‍රාත් ආයතනය විසින් එම අලාභය මණ්ඩලයට ගෙවීමට කටයුතු කරන බවට පොරොන්දු විය. මේ සම්බන්ධයෙන් නීතිපති වෙත යොමුකර ඇති ලිපියට ලැබෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු අඩාල වීම සඳහා හේතු සොයා බලා එයට වගකිව යුතු නිලධාරීන්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පොල් වගාවේ කළමනාකරණ ක්‍රමවේදය පෙන්නුම් කිරීමට ස්ථාපිත කරන ලද ආදර්ශ පොල් වතු සම්බන්ධයෙන් එක් එක් ආදර්ශනයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සති 2 කට වරක් ප්‍රධාන කාර්යාලයේ සැලසුම් අංශයට වාර්තා කළ යුතු නමුත් එවැනි ප්‍රගති සමාලෝචනයක් සිදු වී නොතිබුණි. තවදුරටත් ඒ පිළිබඳ පරීක්ෂා කිරීමේදී වර්තමානය වන විට මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිසි අවධානයක් මණ්ඩලය විසින් යොමු නොකරන බව නිරීක්ෂණය විය. | ආදර්ශ පොල් වතුවල ප්‍රගතිය අධීක්ෂණය සඳහා පොල් සංවර්ධන නිලධාරීන් හා ගොවිපල සැලසුම් නිලධාරීන් ඉඩම් අඛණ්ඩව පරීක්ෂා කර ලොග් සටහන් තබා ඇත. මෙම ව්‍යාපෘතියේ තොරතුරු හා ප්‍රගතිය කෙටි වීඩියෝ පටි මඟින් ලබාගැනීමට තීරණය කර ඇත. | එක් එක් ආදර්ශනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රගති වාර්තාවක් පිළියෙල කරමින් නිසි අධීක්ෂණයක් යටතේ ව්‍යාපෘතියෙහි කටයුතු ඉටු කළ යුතුය. |
| (ඈ) ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල වීමත්, චැක්පත් වෙනස් කිරීම හා කපාහැරීම පිළිබඳව අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු නොකර සහතික කරන නිලධාරින් විසින් එම වෙනස්කිරීම, කපාහැරීම, සහතික කර තිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ සිදු වී තිබු රු.595,060 ක චැක්පත් වංචාවට අදාළ අලාභය අයකර ගෙන එම නිලධාරිනිය සේවයෙන් ඉවත්කර තිබූ නමුත් වගකිව යුතු අධීක්ෂණ නිලධාරින්ට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අධීක්ෂණ නිලධාරියාගේ අධීක්ෂණ ක්‍රියාවලියෙන් බැහැරව නිලධාරිනිය විසින් තනිවම වංචනික ක්‍රියාවේ නිරත වී ඇති බැවින් නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගැනීමක් නොව චෙක්පත් නිකුත් කිරීමේ හා වෙනස් කිරීමේ ක්‍රියා පිළිවෙත පිළිබඳව උපදෙස් මාලාවක් යාවත්කාලීන කර ලබා දී ඇත. | අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කළ යුතුය. පැවති දුර්වලතා පිළිබඳ වගකිව යුක්තන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |
| (ඉ) මණ්ඩලය විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට 2014 වර්ෂයේ වැඩියෙන් ගෙවන ලද රු. 372,537 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටද වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මණ්ඩලයට අයවීමට නියමිත මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) දිවිනැගුම ජාතික වැඩසටහන යටතේ බෙදාහරින ලද පොල් පැළ සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.4,596,475 ක ශේෂයක් වර්ෂ 4 කට වැඩි කාලයක සිට අයකර ගැනිමට නොහැකි වී තිබූ නමුත් මේ සඳහා අඩමාණ ණය වෙන්කිරීමක් හෝ හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මණ්ඩලයට අයවීමට නියමිත මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් විලෝපික මයිටා විද්‍යාගාර 11 ක් පවත්වාගෙන ගොස් තිබූ නමුත් විලෝපික මයිටා දීප ව්‍යාප්ත නිෂ්පාදන විද්‍යාගාර නොමැති වීම, මයිටා පැකට් ප්‍රවාහනය ගබඩාකර තබා ගැනීමේ හා කල්තබා ගැනීමේ ගැටළු හේතුවෙන් පොල් වගාකරුවන්ට අවශ්‍ය පරිදි විලෝපික මයිටා පැකට් ලබා ගැනීමට නොහැකි වී තිබුණි . | විලෝපිත මයිටාවන් වගාකරුවන් වෙත ප්‍රවාහනය කිරීමේ ක්‍රමවේදයක් හා විද්‍යාගාර නොමැති ප්‍රදේශවල වායුසමීකරණ ගබඩා පහසුකම් ඇති කිරීම සඳහා ඉදිරිපත් කරන ලද විශේෂ ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරය විසින් 2019, 2020 හා 2021 වර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. ප්‍රවාහන කටයුතු සඳහා සෑම මයිටා බෑග් එකක් සඳහාම රු. 3.00 ක් බැගින් ප්‍රතිපාදන ලබාදීමත් ප්‍රවාහනයට ප්‍රාදේශීය කාර්යාල වාහන භාවිතා කිරීමට හෝ අපහසු අවස්ථාවලදී කුලී පදනම මත වාහනයක් යොදා ගැනීමටත් ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත උපදෙස් ලබාදී ඇත. | පොල් වගාකරුවන්ගේ ඉල්ලුමට සරිලන සේ මයිටා පැකට් දිවයින පුරා බෙදාහැරීමට කටයුතු කළ යුතු අතර පැකට් ප්‍රවාහනය කිරීම, ගබඩා කර තැබීම හා කල්තියා ගැනීමේ ගැටළු විසඳීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් මඩකලපුව, වැලිපිටිය, කෑගල්ල හා අම්පාර, යන විද්‍යාගාර සේවකයින්ගේ නොසැලකිලිමත්කම සහ රසායනාගාරවල පවතින අයහපත් තත්ත්වය, අවශ්‍ය ජීවානුහරණ උපකරණ නොමැති වීම වැනි හේතූන් මත මෙම විද්‍යාගාර 2018 වර්ෂයේ අග කාර්තුවේදී ආසාදනයට ලක් වී තිබූ අතර වැලිපිටිය මයිටා විද්‍යාගාරය මේ වන විට වසා දමා තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් විද්‍යාගාර 11 ක් තුළ විලෝපිත මයිටාවන් නිපදවීම පුහුණු කළ නව නිලධාරීන් යොදාගෙන සිදුකළ අතර මෙම ක්‍රියාවලිය තුළ විවිධ අවස්ථාවන්වලදී විවිධ ප්‍රමාණයන්ගෙන් අසාධන තත්වයක් ඇතිවිය හැක. | මණ්ඩලයට අයත් විද්‍යාගාර නියමිත ප්‍රමිතීන් යටතේ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැවිලි සවිය ශ්‍රමික බලකාය ව්‍යාපෘති යෝජනාව අනුව ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර තිබූ රු.මි. 50.7 කින් රු.මි. 38.45 ක් පුහුණු කිරීමේ කටයුතු සඳහාද රු.මි. 12.25 ක් පුහුණුව සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහාද වෙන්කර තිබූ අතර එය පිළිවෙලින් සියයට 76 හා සියයට 24 විය. එසේ නමුත් 2019 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය සඳහා ලැබී තිබූ රු.මි. 24.55 ක ප්‍රතිපාදනයෙන් රු.මි. 5.12 ක් පුහුණු කටයුතු සඳහාද, රු.මි. 19.02 ක් ක්ෂේත්‍ර උපකරණ හා ටැබ්ලට් පරිගණක මිලදී ගැනීම සඳහාද භාවිතා කර තිබූ අතර එය පිළිවෙලින් සියයට 22 ක් හා සියයට 79 ක් විය. ඒ අනුව ව්‍යාපෘති යෝජනාවෙන් | අවුරුදු 03 ක් සඳහා වන මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබූ රු.මි. 50.7 ක මුදලින් 2019 වර්ෂය අවසන් වන විට ලබාදී ඇති සියයට 40 ක් වූ රු. මිලියන 24.557 ක් වන මුදලක් යාන්ත්‍රික උපකරණ භාවිතය පිළිබඳ ශ්‍රමිකයන් තුළ මනා අවබෝධයක් ලබාදීම සඳහා ප්‍රමුඛතාවයක් ලබාදී විද්‍යුත් උපකරණ ලෙස ටැබ් යන්ත්‍ර මිලදී ගැනීමට යොදා ගෙන ඇත. | ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන ව්‍යාපෘති යෝජනාවට අනුව එහි මූලික අරමුණු ඉටු කිරීම වෙනුවෙන් යොදා ගත යුතුය. |

බැහැරව මුදල් භාවිතා කර තිබීමෙන් පොල් කර්මාන්තය සඳහා පුහුණු ශ්‍රම බලකායක් පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ලඟාකර ගැනීමට ඉවහල් වී නොතිබූ බව නිරීක්ෂණය විය.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට අදාළව පුරප්පාඩු 13 ක් පිරවීම සඳහා වූ බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට පරිබාහිරව සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ අතර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් හට ලකුණු ලබාදීම අනුමත ලකුණු ලබා දීමේ ක්‍රමවේදයට පටහැනිව සිදුකර තිබූ බවද නිරීක්ෂණය විය. එමෙන්ම තනතුර සඳහා බඳවාගත් 13 දෙනෙකුගෙන් 5 දෙනෙකු සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා නියමිත වූ දිනයේ අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී නොතිබූ අයදුම්කරුවන් වන බවද තවදුරටත් නිරීක්ෂණය විය. | තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 5 දෙනෙකුගේ අත්සන් පොදු අත්සන් ලේඛනයේ නොතැබූ නමුත් බඳවාගැනීමේදී සම්මුඛ පරීක්ෂණ ලකුණු ලේඛනයේ නියමිත පරිදි ලකුණු ප්‍රමාණය ඇතුළත් වී ඇති බැවින් මෙම අයදුම්කරුවන් විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ඇත. පුරප්පාඩු සඳහා අනුමැතිය ලැබෙන තෙක් පූර්ව සූදානමක් ලෙස සභාපතිවරයාගේ උපදෙස් පරිදි එම තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් හා ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවීමට කටයුතු කර ඇති බැවින් 2018/03 දරන කළමණාකරන සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන උල්ලංඝණය කර නොමැති බව සඳහන් කරමි. | අනුමත බඳවාගැනීමේ පටිපාටීන් හා කළමනාකරණ සේවා චක්‍රලේඛයන්ට අනුගතව විනිවිදභාවයකින් යුතුව අනුමත පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) පොල් සංවර්ධන නිලධාරීන් III ශ්‍රේණියේ තනතුරට අදාළව පුරප්පාඩු 30 ක් පිරවීම සඳහා සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් බඳවාගෙන තිබූ නිලධාරීන් 27 දෙනාගෙන් 20 දෙනෙකුටම බඳවා ගැනීමට අදාළ ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට පටහැනිව වැඩි ලකුණු ලබා දී බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම බඳවාගැනීම විනිවිදභාවයකින් හා අපක්ෂපාතීභාවයකින් තොරව සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම මණ්ඩලයේ බඳවාගන්නා ලද පොල් සංවර්ධන නිලධාරීන් 27 දෙනාම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තුනටම සහභාගි වී ඇති බව සම්මුඛ පරීක්ෂණ ලකුණු ලේඛනයට අනුව නිරීක්ෂණය වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් රැගෙන එන සහතික පත් හා එම අවස්ථාවේදී ඔවුන් විසින් ඉදිරිපත් කිරීම් අනුව අවස්ථානුකූලව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දී ඇති අතර දෙන ලද ලකුණු අදාළ ලකුණු ලබාදීමේ සටහන් පත්‍රයන්ට අනුකූලව විධිමත්ව සිදුකර ඇත. | අනුමත බඳවාගැනීමේ පටිපාටීන් හා අනුමත ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුගතව විනිවිධභාවයකින් යුතුව අනුමත පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |